# ප්‍රශංසා එකතු සුපුවත

2017 ජූලි මස 17 වන දින සිට ජූලි මස 23 වන දින දක්වා

**" ක්‍රිස්තුන් වහන්සේගේ මුළු ජීවිතයම පියාණන්ගේ කැමැත්ත සෙවීමකි, ඉටුකිරීමකි "**

01 ප්‍රශංසාව සඳහා අවදිවෙමු :

* යාච්ඤාව තුළ අප විශ්වාසයෙන්, සමිඳාණන් වහන්සේට විවෘත වෙමු නම් ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත මේ මොහොතේ අප සිටින ජීවිත තත්ත්වය තුළම හෙළිදරව් කරන සේක.
* මොහොතකට දෙනෙත් වසා ගෙන, මේ මොහොතේ අපගේ ඇතුලාන්ත තත්ත්වය හඳුනා ගනිමු.
* අපව නතුකර ගන්නට කියා,ශබ්ද නගා ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් අයැද සිටිමු.
* පුබුදු ගී අංක 01 "පිය පුත් සුදතුම් - සමිඳුට විශ්වයේ....."

02. පසුගිය සතියේ සුපුවත මුල් කරගෙන අත්දැකීම් කීපයක් බෙදා ගනිමු.

* සමිඳාණන් වහන්සේ කියන කොයි දෙයක් වුවද කරන්න. මන්ද දේව සමානකමට හා දේව ස්වරූපයට අප මවා ඇත. එහෙයින් ශුද්ධවූ කැමැත්ත අභිමුව "ආමෙන්" යයි පිළිතුරු දීමට ශුද්ධාත්මයාණන් වහන්සේ අපට බලය දානය කර ඇත.
* අත්දැකීම් කීපයක් පොදුවේ බෙදා ගනිමු.

03. දවසේ සුපුවත : (ශුද්ධාත්ම රැළියේ තේමා දේශනය ඇසුරෙනි)

* මෙවර ශුද්ධාත්ම ආගමන මංගල්‍යය මුල් කරගෙන, පිටස්තර මුද්‍රණාලයකින් ලිපි කවර මුද්‍රණය කිරීමේදී ඔවුන්ගේ මුද්‍රණ දෝෂයක් නිසා Lord යන වචනය වෙනුවට Load යන වචනය මුද්‍රණය කර තිබුණි. මෙම සිදුවීම සමිඳාණන් වහන්සේට ලොකු අගෞරවයක් සේ පෙණුන බැවින්, එම වරද නිවැරදි කරන්නට දිවැසි එකතුවක් හැටියට සාංඝික වන විට වචනයක් ලැබුණි. එනම්, සුදතුම් ගමන සඟරාව තුළ තිබූ ඉඩකඩ පහසුකම ලැබීම තුළ එය යළි නිවැරදි කරන ලෙසයි.
* මෙම සිද්ධිය තුළ සමිඳාණන් වහන්සේ ඔබගේ / මගේ එවැනි තත්ත්වයන් පිළිබඳව කුමක් පවසත්ද යන්න සාකච්ඡා කොට බෙදා ගන්න.

04. ක්‍රිස්තුන් වහන්සේ දෙස බලමු. (ශු.මතෙව් 6:9-10)

* ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනි, ඔබ වහන්සේගේ නාමයට ගෞරව වේවා! ඔබගේ රාජ්‍යය පැමිණේවා! ඔබ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද එසේම වේවා !

05. වචනයේ සේවකයා සඳහා:

* ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට දේව රාජ්‍ය පිහිටුවීම යනු, තම පියාණන්ගේ ශුද්ධවූ කැමැත්ත, අභිප්‍රාය සෙවීමකි. එය පූර්ණ ලෙස ඉටු කිරීමකි.
* ඔවුන් වහන්සේ මෙලොවට වැඩම කළේද සැබෑ මිනිස් පුතෙකු ලෙස ජීවත් වූයේද ජීවිතය පූජා කළේද රාජ්‍ය පිහිටුවීමටය.
* සැබෑ මනුෂ්‍ය පුත්‍රයාණන් ලෙස මෙලොවේදී අත් දුටු සෑම මනුෂ්‍ය පුත්‍රභාවයේ අත්දැකීමක්ම දේව රාජ්‍යයේ උදාව සඳහා යොමු කළ සේක. ඔවුන් වහන්සේ කුරුස ගසේදී හෙළූ හුස්ම පොදු පවා ප්‍රේමයේ රාජ්‍ය ප්‍රකාශ කිරීමකි.
* සමිඳාණන්ට අපගේ නමස්කාරය පුද කරමු.
  පුබුදු ගී අංක 221 "ජේසුනි සමිඳේ....."

06. අවසාන ප්‍රශංසාව සඳහා මඟපෙන්වීම:

* අපගේ මිනිස් දුබලකම් දෙස ඔවුන් වහන්සේ ඉමහත් දයානුකම්පා සහිත ප්‍රේමයකින් බලන සේක.

* හෙබ්‍රෙව් 4:15 **"මන්ද අපට ඇත්තේ අපේ දුබලකම ගැන අනුකම්පාවක් නැති උත්තම පූජකයෙකු නොව, හැම අයුරින්ම අප වාගේ පරීක්ෂාවලට මුහුණ පෑ පාප රහිත උත්තම පූජකයෙකි."**
* එබැවින් යාච්ඤාව මගින්, බිය සැක නැතුව කරුණාවේ සිංහාසනය වෙත ළඟා වෙමු.

====================

## ප්‍රශංසා එකතු සුපුවත

2017 ජූලි මස 24 වන දින සිට ජූලි මස 30 වන දින දක්වා

**" පසුතැවී සිත් හරවා ගෙන දෙවි සමිඳාණන් වෙත හැරෙන්න"**

01 ප්‍රශංසාව සඳහා :

* කුඩා දරුවන් අවංකය. කිසිදු මවා පෑමක් ද, කෘතිම බවක් ද ඔවුන් තුළ නැත. කොතැන වුවද , කවුරුන් ඉදිරියේ වුව ද තමා තමාමය.
* මොහොතකට දෙනෙත් වසා ගනිමින් සමිඳාණන් වහන්සේගේ හඬට සවන් දෙමු.
  **"ඔබ වෙනස් වී කුඩා දරුවන් මෙන් නොවුනොත්, කිසි සේත් ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නාහුය"**
* මෙම වචන ස්වල්පය ඇතුලාන්තයට අයිති කර ගනිමු. ශුද්ධාත්මයාණන් වහන්සේට ආයාචනා කරමු ඔබ වෙතට / මා වෙතට ගින්නක් සේ වඩින්නට කියා.
* පුබුදු ගී අංක 223 "ශුද්ධාත්මයාණෙනි// වඩින්න රැගෙන ගින්න ඔබගේ......
  පවිත්‍ර කරන්න හද මගේ ....."
  (මුල් කොටස පමණක් ගායනා කරමින් ප්‍රශංසාවට ඇතුළු වෙමු)

02. පසුගිය සතියේ අත්දැකීම් කීපයක් බෙදා ගනිමු.

* ක්‍රිස්තුන් වහන්සේගේ මුළු ජීවිතයම පියාණන් වහන්සේගේ කැමැත්ත සෙවීමයි. ඉටුකිරීමයි.
* දේව කැමැත්ත ඉදිරියේ අපගේ ප්‍රතිචාරයන් කෙසේ වීද? බෙදා ගනිමු.

03. සතියේ සුපුවත (ශුද්ධාත්ම රැළියේ තේමා දේශනය ඇසුරෙනි)

* අපි තව වසර 4කින් 50 වෙනි ජුබිලිය සඳහා සූදානම් වෙනවා. අපි කෙසේද සූදානම් වන්නේ? උත්සව පවත්වමින් නොවේ. ශුද්ධාත්මයාණන් වහන්සේ කරණ කොට ගෙන අපගේ ජීවිත අලුත් කර ගනිමින්. අද මෙම මංගල රාත්‍රියේ සිට අපි පුබුදු ජනතාවක් හැටියට සූදානම් වීම සඳහා , ඉතිරි වසර 4ක් මනස්ථාපනයේ වසර 4ක් හැටියට ප්‍රකාශයට පත් කර ඇත.
* ශුද්ධාත්ම මංගල රාත්‍රියේ සිදු කළ මෙම ප්‍රකාශනය මුල් කරගෙන, සමිඳාණන් වහන්සේ ඔබට / මට කුමක් පවසයිද? ශුද්ධවූ කැමැත්ත ඉදිරියේ මොහොතක් යාච්ඤා ස්වරූපයෙන් පෙනී සිටිමු ශුද්ධාත්මයාණන් වහන්සේ අපට කථා කරන සේක. එම හඬ ශබ්දය එකිනෙකා සමඟ සාංඝික කර ගනිමු.

04. වචනයේ සේවකයා සඳහා : (ශු.මතෙව් 18:1-4)

* අපට ආරාධනා කරන්නේ කුඩා ළමුන් මෙන් වීමටයි. ලාමක වීමට නොවේ. එනම් ඔවුන්ගේ චරිත ලක්ෂණ වලට, ජීවිත ස්වභාවයන් වලට ඇතුළු වීමටයි. වැඩිහිටි අපට ඔවුන්ගේ ඇතුලාන්ත අත්දැකීම ස්වර්ගයට යාමට මාවතක් බවයි.

(අ) කුඩා ළමුන් ඇත්ත ඇති සැටියෙන්ම ප්‍රකාශ කරයි. ඔවුන් හරි විවෘතයි. ළමුන්ගේ බාහිර ක්‍රියාකාරකම් වලින් පෙන්නුම් කරන්නේ ඔවුන්ගේ සැබෑ ඇතුලාන්ත ස්වභාවයයි.

(ආ) දෙමාපියන් තුළ සැබෑ ලෙස යැපීමේ ජීවිතයක් ගත කරයි. ඔවුන් සුරක්ෂිත භාවයක් අත්දකී. මොහොතේ ජීවිතයක් ගත කරයි.

(ඇ) එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන සිද්ධීන් තුළ ඇතිවන තරහව, ක්‍රෝධය, ද්වේශය, ඇති වුනත් පලිගැනීමකට පත්කර නොගනී. විවිධාකාර සිත් රිදීම්, වේදනාවන් ඉදිරියට ගෙන නොයයි. සබඳතා බිඳ නොගනී. ඉක්මණින් යථා තත්ත්වයට පත් වෙයි. යලි සන්සුන්ව ඉදිරි ජීවිතයට මුහුණ දෙයි. විශේෂතම ගුණාංගය වන්නේ..... තම දෙමව්පියන් වැඩිහිටියන් කෙරෙහි තබන විශ්වාසවන්ත කමයි.

05. අවසාන යාච්ඤාව : (අප කෙරෙහි අවදි වෙමු)

* අතීත මතකයන් වලින්, අප්‍රසන්න හැඟීම් වලින්, දුක් දොම්නස් වලින් අපගේ සිත් පිරී ඇත.
* වෛරය, තරහව, ක්‍රෝධය, රිදවීම්, පලිගැනීම්, ඇතුලාන්ත වැලපීම ඒවායේ ලක්ෂණ වේ.
* අපේ සැබෑ තත්ත්වයන් පිළිගෙන සමිඳාණන්ගේ ශුද්ධවූ කැමැත්ත අභියස පෙනී සිටිමු.
* පුබුදු ගී අංක 227 "හැරෙනා පිණිස හරවන්න මා සමිඳේ....."

=========================

## ප්‍රශංසා එකතු සුපුවත

2017 ජූලි මස 31 වන දින සිට අගෝස්තු මස 05 වන දින දක්වා

### " දිළිඳුන්ගේ ආධ්‍යාත්මිකත්වයට ඇතුලු වීමට සමිඳාණෝ අප කැඳවන සේක"

01 ප්‍රශංසාව සඳහා :

* **"එතුමාණෝ සිය දාසියගේ දීනතාව කුළුණු පාමින් සලකා වදාළ සේක."** (ශු.ලූක් 1:48)
* භාග්‍යවන්ත අම්මාගේ ප්‍රශංසාවේ තේමාව වූයේ, දීනයන් උසස් කල දෙවි සමිඳාණන් වහන්සේය. ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත අගයමින් අපිදු එතුමිය සමඟ ප්‍රශංසා කරමු.
* පුබුදු ගී අංක 229 "හදවත මගේ සමිඳුන්ගේ ගුණ පසසන්නේ...."

02. පසුගිය සතියේ අත්දැකීම් බෙදා ගනිමු.

* පසුතැවී සිත් හරවා ගෙන දෙවි සමිඳාණන් වෙත හැරෙන්න. මන්ද දේව රාජ්‍යය උරුම වන්නේ බාලයන්ගේ ඇතුලාන්ත ස්වභාවය මගින්, දේව රාජ්‍යයේ වටිනාකම් තුළ ජීවත් වීමෙන් හා ඊට සාක්ෂි දැරීමෙන්.
* ඔබේ අත්දැකීම පොදුවේ බෙදා ගන්න.

03. සතියේ සුපුවත (ශුද්ධාත්ම රැළියේ තේමා දේශනය ඇසුරෙනි)

* දිනක් මම හොඳටම මහන්සි වෙලයි ගෙදර ගියේ. ඒ නිසා මම මටම කියා ගත්තා, මම දැන් හොඳ නින්දකට යන්න ඕනා කියලා. දැන් නම් කවුරු හරි ගේට්ටුව ළඟට ආවොත්, තට්ටු කලොත් මම නම් ගේට්ටුව අරින්නෙ නැහැ කියලා. ඒ මොහොතේ කව්දෝ කෙනෙක් ගේට්ටුවට තට්ටු කළා. මම ජේසුට කිව්වා මට නම් දැන් එතැනට යන්න බැහැයි කියලා. සැනෙකින් ඔවුන් වහන්සේ මට පිළිතුරක් දුන්නා. 'රන්ජනා එතැන සිටගෙන ඉන්නේ මමයි' කියලා. මම වහාම ගේට්ටුව ළඟට ගියා. අම්මා කෙනෙක්. ඇය කිව්වා, 'මගේ පුතාට විභාගයට යන්න සල්ලි නැහැ' කියලා. මම ඇවිත් මගේ බෑග් එකේ තිබුනු මුදල් ඔක්කොම ලියුම් කවරයක දමා ඇයට දුන්නා. ඒ මොහොතේ ගේට්ටුව අසලදී මම ක්‍රිස්තුන් වහන්සේව හමු වුනා.

* ඉහත සඳහන් ප්‍රකාශය තුළින් ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබට/මට කුමක් පවසයිද? ඔවුන් වහන්සේගේ හඬට සවන් දෙමින් කීප දෙනෙකු සමඟ බෙදා ගන්න.

04. වචනයේ සේවකයා සඳහා : (රෝම 14:22)

**"තමා හරි යයි පිළිගන්නා දේ ගැන යමෙකුගේ සිත දොස් නොකියයි නම් ඒ මිනිසා වාසනාවන්තයෙකි."**

* හෘද සාක්ෂිය යනු දේව හඬයි. දේව හඬ තුළින් සමිඳාණන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත අපට හෙළිදරව් කරන සේක. දිළිඳුන්ගේ අධ්‍යාත්මිකත්වයට ඇතුළු වෙන්නැයි ඔවුන්ට සාංඝික වෙන්නැයි සමිඳාණෝ අපව මෙසේ කැඳවන සේක.
* අප සොයන ගැළවීම, සාමය, ප්‍රීතිය, නිදහස මනුෂ්‍ය කැමැත්ත මගින්, ලෞකික දෑ තුළින් ලබා ගත නොහැක. අප බලාපොරොත්තු වන දේව රාජ්‍යය වෙත ළඟා විය හැක්කේ ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත ඉටු කිරීමෙනි.
* දිළිඳුන්, දිළිඳුන් වීම සමිඳාණන්ට ප්‍රසන්න කාරණාවක් නොවේ. මන්ද ඔවුහු නන් අයුරින් පවුල තුළ, සමාජය තුළ පීඩා විඳිති. එහෙයින් දීනයන් උසස් කරනු වස්, සමිඳාණන් වහන්සේ දිළිඳුන් උදෙසා දිළිඳු වීමට දිළිඳුන්ගේ සංඝයක් වීමට අප කැඳවන සේක.

05. අවසාන යාච්ඤාව:

* දිළින්දෙකු ලෙස අප අතරට වැඩම කොට, ස්වර්ගීය උරුමය ලබන්නට අපට පරමාදර්ශයක් දානය කල ධර්මයාණන් මුල් කරගෙන පියාණන් වහන්සේට ප්‍රශංසා කරමු.
* දිළිඳුකමේ ආධ්‍යාත්මිකත්වයට ඇතුළු වීමට "මා අනුව එන්නැ"යි අප කැඳවීම ගැන ඔවුන් වහන්සේට තුති පුදමු.
* කිතු දන පුබුදුවේ අධ්‍යක්ෂක පියතුමා වන ස්වාමි තාත්තා ගත කරන ජීවිත අත්දැකීම මුල් කරගෙනද සමිඳාණන් වහන්සේට ප්‍රශංසා කරමු.
* සැබෑ මනස්ථාපනයකට අපව රැගෙන යන්නයි කියා ශුද්ධාත්මයාණන් වහන්සේට අයැද සිටිමු

******************